# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2455/24 – 2025 සැප්තැම්බර් මස 25 වැනි බ්‍රහස්පතින්දා – 2025.09.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

**5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය**

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 241A, කිරිවැල්දොල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බෙවරලිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක MA/KTP/2019/552 හා 2024.12.09 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

**01. කැබැලි අක්ෂර ‘A’ - සෝෂන් වත්ත හෙවත් මාණික්ක වත්ත - ප්‍රමාණය : හෙක්. 4.5000 ක් පමණ**

උතුරට : සිංහරාජ රක්ෂිතය සහ ඇළ; නැගෙනහිරට : ඇළ සහ යූනියන් බැන්ක් පීඑල්සී සමාගම හිමිකම් කියන සෝෂන් වත්ත; දකුණට : යූනියන් බැන්ක් පීඑල්සී සමාගම හිමිකම් කියන සෝෂන් වත්ත සහ සිංහරාජ රක්ෂිතය; බටහිරට : සිංහරාජ රක්ෂිතය.

කේ. ඩී. ලාල් කාන්ත,<br>
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ<br>
වාරිමාර්ග අමාත්‍ය.

මගේ අංකය: 4-3/3/2019/FR/263.<br>
2025 ජූලි මස 24 වැනි දින.<br>
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,<br>
“මිහිකත මැදුර”,<br>
රජමල්වත්ත පාර,<br>
බත්තරමුල්ල.

1A – G 045440 – 19 (2025/09)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*